# ඇබෑර්තු

## වාරිමාර්ග අමාත්‍යාංශය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ රජයේ බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව පහත සඳහන් තනතුරු සඳහා **"කොන්ත්‍රාත් පදනම"** මත ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් පළපුරුද්ද සහ කැපවීම සහිත ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

- තනතුරු සඳහා වන වැටුප් ඉහත කී MSD චක්‍රලේඛ අංක 01/2019 හි 3 වන වගුවේ සඳහන් කර ඇත.
- අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ දැනුම සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයන් වේ. විදේශ අරමුදල් යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත විශේෂයෙන් ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සැලකිල්ලට ගනු ලැබේ.

| අංකය | PS කාණ්ඩය | තනතුර | තනතුරු සංඛ්‍යාව | බඳවා ගැනීමේ පදනම | අදාළවන චක්‍රලේඛය |
|---|---|---|---|---|---|
| 01 | PS3 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශේෂඥ (අධීක්ෂණය, ඇගැයීම හා ඉගැනීම) | 01 | කොන්ත්‍රාත් | MSD චක්‍රලේඛ 1/2019 |
| 02 | PS3 | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ විශේෂඥ | 01 | කොන්ත්‍රාත් | |
| 03 | PS5 | සමාජ හා පරිසර ආරක්ෂක නිලධාරී | 01 | කොන්ත්‍රාත් | |
| 04 | PS5 | සන්නිවේදන නිලධාරී | 01 | කොන්ත්‍රාත් | |
| 05 | PS6 | ව්‍යාපෘති ලේකම් | 01 | කොන්ත්‍රාත් | |

වැඩිදුර තොරතුරු සඳහා **www.irrigationmin.gov.lk** වෙබ් අඩවියට පිවිසෙන්න. වැඩි විස්තර හා ඉහත සඳහන් චක්‍රලේඛය සඳහා මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් 2024 මැයි 20 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු අතර, අයදුම්කරන තනතුර අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA),**
**අංක 11, ජාවත්ත පාර,**
**කොළඹ 05.**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, තනතුරු අංක 01, 04 හා 05 සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**
**දිනය : 2024.05.05**